# කෝට්ටයාවත්තේ සර්වාංග වෙදකම

වෛද්‍ය තාරක සමන්ත ශ්‍රී

වසර 800 කට වඩා පැරණි ඉතිහාසයකට උරුමකම් කියන කෝට්ටයාවත්ත සර්වාංග වෙද පරම්පරාවේ වර්තමාන වෙදදුරු වන්නේ සේමසිංහ නවරත්න චන්ද්‍රසේකර වන්නිනායක මුදියන්සේලාගේ රන්බණ්ඩා වෙදමහතා ය.

රෝග පරීක්ෂාවේ දී නාඩි පරීක්ෂාව ප්‍රධාන වශයෙන් සිදු කරන අතර දර්ශන, ස්පර්ශන, ප්‍රශ්න යන ත්‍රිවිධ පරීක්ෂාවන්ට අමතර ව රෝගියාගේ ජන්ම පත්‍රය පරීක්ෂා කර අපල උපද්‍රව හා රෝග තත්ත්ව හඳුනා ගැනීමත් එම අවස්ථාවන්ට දෛව ව්‍යාපාශ්‍රය හා යුක්ති ව්‍යාපාශ්‍රය චිකිත්සා නිර්දේශ කිරීමත් මේ ප්‍රතිකාර ක්‍රමයේ දී විශේෂ තැනක් ගනී.

අංශභාගය, වකුගඩු රෝග, මධුමේහ, අතිරක්තචාපය, අර්ශස්, අන්ත්‍රවෘද්ධි, විවිධ අක්මා රෝග, අපස්මාර, වන්ධ්‍යාභාවය, විවිධ ප්‍රදර රෝග සඳහා කෝට්ටයාවත්ත පාරම්පරික වෙදකම ඉතා ප්‍රසිද්ධියක් උසුලයි.

විශේෂයෙන් වෙනත් ප්‍රතිකාර වලට යොමු ව සුව කළ නොහැකි බවට නිර්දේශ කළ මෙවැනි අසාධ්‍ය රෝගීන් දහස් ගණනකට සුවය ලබා ගැනීමට කෝට්ටයාවත්ත පාරම්පරික ප්‍රතිකාර තුළින් හැකියාව ලැබී ඇත. කෝට්ටයාවත්ත වෙදකමෙහි පිළිකා රෝග සඳහා  භාවිත කරන ලුණු දෙහි කල්කය, ජම්බීර  කල්කය, විනරාජ කල්කය, කවිදෝෂ කල්කය, දල කුමාර කල්කය, මහා විනරාජ කල්කය මෙන්ම අංශභාග රෝගීන් සඳහා භාවිත කරන අග්නිරාජ තෛලය, වකුගඩු රෝග සඳහා භාවිත කරන මහා කඳකුමාර තෛලයත්, මධුමේහ රෝගීන් සඳහා භාවිත කරන ප්‍රමේහ රකුසු තෛලයත් එම පරම්පරාවට ආවේණික විශේෂිත ඖෂධ වේ. මේ සියලු ඖෂධ වෙදදුරුතුමා විසින් ම සාදා ගන්නා අතර ඖෂධ නිෂ්පාදනයට පෙර සුභ දින  නැකැත් යෝග සලකා බලා කටයුතු කරනු ලබයි.

සන්නියකුන්, භූතදෝෂ, ග්‍රහ දෝෂ පිළිබඳ දැඩි විශ්වාසයක් මෙන් ම ඒ පිළිබඳ අත්දැකීම් ද පරම්පරාව සතුව හා වර්තමාන වෙදදුරු රන්බණ්ඩා මහතා සතුව ද පවතින හෙයින් දෛව ව්‍යාපාශ්‍රය චිකිත්සාවට මුල් තැනක් දී කටයුතු කරනු ලබයි.

ඖෂධ ලෙස තෙල් වර්ග පානයට දීම ද මෙම ප්‍රතිකාර ක්‍රමයේ විශේෂ ලක්ෂණයකි. වර්තමානයේ පවතින බොහෝ ලෙඩ රෝග සංඛ්‍යාවකට විටින් විට වෙළඳපොලට එන නව ඖෂධ වර්ග හේතු වන බව එම වෛද්‍යතුමන්ගේ අත්දැකීම වන අතර, කෘෂි රසායන ද්‍රව්‍ය යෙදූ කෘත්‍රිම ආහාර භාවිතයෙන් ඇත් වී සාම්ප්‍රදායික ආහාර රටාවකට හුරු වීමද දූෂිත නොවූ පරිසරයක මානසික සැහැල්ලුවෙන් යුතුව ජීවත් වීමද ක්‍රියාශීලී ජීවිතයක් ගත කිරීමට රෝග වලින් මිදීමට ඇති එකම මග ලෙස වෛද්‍යාචාර්ය තුමා අත්දැකීමෙන් පසක් කොට ගෙන සිටී.